# සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාග - 2015

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පහත විස්තර සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීමට තරඟ විභාග පැවැත්වීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරු නාම | අධ්‍යාපන සුදුසුකම් | | තාක්ෂණික හෝ වෙනත් සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් | | |
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල් / යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණිය | භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම. | පැරණි නිර්දේශය අනුව ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යාව විෂයයන් 03 කින් සමත්වීම හෝ නව නිර්දේශය අනුව භෞතික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය වන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම. | ජාතික තාක්ෂණික සහතිකය ලබා තිබීම හෝ ඊට සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම<br>සටහන :<br>1. සිවිල් / යාන්ත්‍රික යන ක්ෂේත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී එක් එක් ක්ෂේත්‍රයට අදාළ සහතිකය ලබා තිබීම අනිවාර්යය වේ. | කාර්මික නිලධාරී (සිවිල්) පුහුණු ශ්‍රේණිය හා / හෝ II 'ආ' බණ්ඩය - 49 |
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල් / යාන්ත්‍රික) II 'ආ' බණ්ඩය | භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම. | පැරණි නිර්දේශය අනුව ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යාව විෂයයන් 03 කින් සමත්වීම හෝ නව නිර්දේශය අනුව භෞතික විද්‍යාව හෝ සංයුක්ත ගණිතය හෝ උසස් ගණිතය යන විෂයයන්ගෙන් එකක් සහිතව විද්‍යාව විෂයයන් තුනකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම. | පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා තිබීම.<br>I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව<br>II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව.<br>III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව<br>IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව<br>V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.<br>VI. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම.<br>සටහන :<br>1. ඉහත I සිට VI දක්වා වූ සුදුසුකම් සපුරා ඇති අය එම පාඨමාලා හැදෑරීමට බඳවා ගන්නා අවස්ථාවේ එම පාඨමාලාවන්ට ඇතුළත්වීමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.<br>2. සිවිල් / යාන්ත්‍රික යන ක්ෂේත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී එක් එක් ක්ෂේත්‍රයට අදාළ සහතිකය ලබා තිබීම අනිවාර්යය වේ. | කාර්මික නිලධාරී (යාන්ත්‍රික) පුහුණු ශ්‍රේණිය හා / හෝ II 'ආ' බණ්ඩය - 01 |
| සමුපකාර සංවර්ධන නිලධාරී | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් 06) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම. | ආර්ථික විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, ගණකාධිකරණය, ව්‍යාපර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළුව අ.පො.ස. (උ.පෙළ) විභාගයේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්වීම. | ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ගණකාධිකාරණ හෝ විගණන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම.<br>හෝ<br>ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත්ව තිබීම හෝ ඊ හා සමාන සුදුසුකම් ලබා තිබීම<br>හෝ<br>පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම. | 41 |

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය : 2015-06-10

03. පොදු සුදුසුකම් :

(අ) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ) 2015-06-10 දිනට පූර්වාසන්න වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුළ තිබිය යුතුය.

(ඈ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස

කාර්මික නිලධාරී (සිවිල් / යාන්ත්‍රික) - අවු. 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි සමුපකාර සංවර්ධන නිලධාරී - අවු. 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි.

04. මෙම තනතුරුවලට අදාළ වැටුප් පරිමාණ :

| තනතුරු නාමය | වැටුප් පරිමාණය |
|---|---|
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල් / යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණිය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (II) අනුව හිමි මාසික දීමනාව<br>1 වසර - රු. 12,920/-<br>2 වසර - රු. 13,040/- |
| ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල් / යාන්ත්‍රික) II 'ආ' බණ්ඩය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2008 අනුව හිමි මාසික වැටුප් පරිමාණය<br>රු. 15005-4X180-6X240-11X320-20X360-27,885/- |
| සමුපකාර සංවර්ධන නිලධාරී | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) අනුව හිමි මාසික වැටුප් පරිමාණය<br>රු. 15005-4X180-6X240-11X320-20X360-27,885/- |

05. මෙම බඳවා ගැනීම් කිරීමට අදාළ අයදුම්පත්‍ර, විභාග විෂය නිර්දේශ හා අදාළ සියලුම තොරතුරු **www.sg.gov.lk** වෙබ් අඩවියේ පළකර ඇති අතර අවශ්‍ය තොරතුරු එම වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**සුනේත්‍රා ගුණවර්ධන**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**සබරගමුව පළාත.**
2015-05-08